# සමකාලීන ශ්‍රී ලාංකේය රාජ්‍ය මාධ්‍ය ප්‍රතිපත්තිය වාර්ගික ඒකාග්‍රතාවය ඇති කිරීම කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

2014 ජුනි මස අළුත්ගම දර්ගානගරයේ ඇති වූ සිංහල – මුස්ලිම් කෝලාහලය පිළිබඳව වාර්තාකරණය ඇසුරින් කරන ලද ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයනයක්

**කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව (ජනසන්නිවේදනය) සඳහා ඉදිරිපත් කරන ස්වාධීන පර්යේෂණ නිබන්ධනයකි.**


නම : එල්.ඩී.සී.ජේ.කුමාර

ශිෂ්‍ය ලියාපදිංචි අංකය : FGS/M/MSSc/2006/08

අධ්‍යයන වර්ෂය : 2015



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1173 |
| වර්ග අංකය: | |



ජනසන්නිවේදන අධ්‍යයන අංශය

සමාජීය විද්‍යා පීඨය

කැළණිය විශ්වවිද්‍යාලය.


2015 මාර්තු

## නිබන්ධන සාරාංශය

සමකාලීන ශ්‍රී ලාංකේය රාජ්‍ය මාධ්‍යය ප්‍රතිපත්තිය වාර්ගික ඒකාග්‍රතාවය ඇති කිරීම කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳව මුද්‍රිත මාධ්‍යය(පුවත්පත්) වාර්තාකරණය ඇසුරින් කරන ලද පර්යේෂණාත්මක ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් මෙම නිබන්ධනයෙන් ඉදිරිපත් කෙරේ. විවිධ කාල සීමාවන් තුළදී ශ්‍රී ලංකාවේ බලයට පත් ආණ්ඩු විසින් කලින් කලට පනවන ලද නීතිරීති, අණපනත් සහ රෙගුලාසි ඇතුළු ජනමාධ්‍යය ක්ෂේත්‍රයේ වෘත්තියවේදීන් විසින් සම්ප්‍රදායානුකූලව පිළිගෙන පවතින ආචාර ධර්මවලට ද අවධානය යොමු කරමින් වාර්ගික ඒකාග්‍රතාවය සඳහා මාධ්‍යය භාවිතය සිදුවන්නේ කෙසේද යන්න සහ වාර්ගික ඒකාග්‍රතාවය සඳහා මාධ්‍යය කටයුතු කරන්නේ ද යන්න  අධ්‍යයනය කරන ලදී.

ඒ අනුව ගැටුම් සහිත සිද්ධි වාර්තාකරණයේදී වාර්ගික ඒකාග්‍රතාවය උදෙසා පුවත්පත් මාධ්‍යය කටයුතු කරන්නේ කෙසේද යන්න සහ ඒ සඳහා පුවත්පත් ආයතනවලට වගකීමක් සහ වගවීමක් පැවතියේද යන්න ද මෙම පර්යේෂණයේ දී අධ්‍යයනයට ලක්කරන ලදී. ඒ සඳහා දිනමිණ, ලංකාදීප, දිවයින, රාවය සහ ලංකා යන පුවත්පත් තෝරාගෙන, 2014 ජුනි මාසයේ කළුතර දිස්ත්‍රික්කයේ අළුත්ගම නගරයේ දර්ගානගර ප්‍රදේශයේ සිදු වූ සිංහල-මුස්ලිම් කෝලාහලය එම පුවත්පත් මගින් වාර්තාකරන ලද ආකාරය සහ එමගින් ජනතාවට ඇති කරන ලද බලපෑම කෙබඳුද යන්න අධ්‍යයනය කරන ලදී.

රටේ පිළිගත් පොදු නීතිමය පසුබිම තුල රැඳෙමින් ඉහතින් සඳහන් කරන ලද මාධ්‍යය නියාමන ක්‍රමවේද හඳුන්වා ඇතත්, එම නීතිරීති සමුදය තුළ වාර්ගික ඒකාග්‍රතාවය උදෙසා ඉවහල් කරගත හැකි සෘජු නෛතික ප්‍රවේශයක් හෝ මාර්ගෝපදේශ සංග්‍රහයක් නොමැති වීමෙන්  සමකාලීන ශ්‍රී ලාංකේය මාධ්‍යයවෙත සමාජයට බලපෑම් කිරීමේ අසීමිත නිදහසක් උරුමකර දී ඇති බව හඳුනාගත හැකි වේ. අති නවීන ඩිජිටල් සන්නිවේදන තාක්ෂණයෙහි පවතින බලය මගින් පුද්ගල චින්තනය ක්ෂණිකව වෙනස් කිරීම සඳහා මාධ්‍යයවෙත අසීමාන්තික ප්‍රවේශ පහසුකම් සහ ක්‍රමවේද නව මාධ්‍යය භාවිතාව ඔස්සේ, මාධ්‍යයට සහ පුද්ගලයන්ට ප්‍රදානය කර ඇති බැවින් අනාගත සමාජයේ සමාජ ඒකාබද්ධතාවය සහ වාර්ගික ඒකාග්‍රතාවය උදෙසා වඩාත් නව්‍ය වූ මාධ්‍යය ප්‍රතිපත්ති සම්පාදනයක අවශ්‍යතාව මෙම නිබන්ධනයෙන් අවධාරණය කෙරේ.



**පාරිභාෂික පදමාලාව** – 2014 ජුනි දර්ගානගර සිංහල මුස්ලිම් කෝලාහලය, වාර්ගික ඒකාග්‍රතාවය, රාජ්‍ය මාධ්‍යය ප්‍රතිපත්තිය, මුද්‍රිත මාධ්‍යය සන්නිවේදනය, සමාජ ඒකාබද්ධතාව

# Abstract

This Thesis presents a case study in association of reporting about printed media Communication (news papers) on the influence caused towards communal concentration by contemporary Sri Lankan state media policy. This study was conducted to ascertain as to whether media is used and how media is used regarding communal concentration with the emphasis on ethics traditionally acknowledging the rules, regulations and ordinances imposed by the governments came to power in Sri Lanka from time to time on professionals in the field of mass media.

Special attention was paid in this research to study to ascertain as to whether the newspaper institutions had a responsibility in reporting struggles related to communal concentration and as to low they act in the case of reporting the same. Accordingly, this study was extended to find out the manner in which the Sinhala Muslim conflict that took place in June 2014 at Dharganagara area of Aluthgama town in Kalutara District was reported and the impact caused by the same on people in association with "Dinamina" , " Lankadeepa" " Divaina" , " Raavaya" and " Lanka" news papers.

Although the above mentioned media regulatory methodologies have been introduced within an accepted common legal back ground of the country, it could be identified that the contemporary Sri Lankan media has been inherited with an unlimited freedom of causing impacts on Sri Lankan society as there is no legal access or code of ethics or guidance within the above legal concept in respect of communal concentration. As the power has been granted to the media and people through the usage of extensive access facilities and methodologies along the novel media by most modern digital communication technology to effect changes in the thoughts of people, this dissertation emphasizes on the compilation of new state media policies for future social consolidation and communal concentration.



**Key words -** Sinhala Muslim conflict at Dharganagara in June 2014, Communal concentration, State media policy, Printed media communication, Social consolidation.